ශීර්ෂය 270 - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 270 - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	දමන, අඩ්ඩාලච්චේන, තිරුක්කෝවිල් යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් ඉඩම් ද පදියතලාව හා දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකට අයත් නිල නිවාස හා රජයේ නිවාස ද තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.	මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් ඉඩම්, නිල නිවාස හා රජයේ නිවාස තක්සේරු කර දෙන ලෙස වසර ගණනාවක සිට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් ඉදිරිපත් කර සිහි කැඳවීම් ද යවා ඇත. මේ පිළිබඳව 2025 මාර්තු 18 දින පැවති දිස්ත්‍රික් විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදී එළඹි තීරණය අනුව තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව ලැබෙන තෙක් දිස්ත්‍රික් ලේකම් විසින් පත් කරන ලද කමිටුවක් මගින් දළ තක්සේරුවක් සිදුකර එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු ආරම්භ කර ඇත.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වත්කම් හඳුනාගෙන ඒවා නිවැරදිව තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.
(ii)	2017 හා 2018 වර්ෂයන්හි දී ඉදිකරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පහළොවකට අයත් නිල සෙවණ ගොඩනැගිලි වටිනාකම රු.46,422,256 ක් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.	2017 හා 2018 වර්ෂයන්හි දී ඉදිකරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පහළොවකට අයත් නිල සෙවණ ගොඩනැගිලි වටිනාකම රු.46,422,256 ක් වූ අතර මේ වන විට එයින් රු.37,524,313 ක ගොඩනැගිලි වටිනාකම මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇත. ලාහුගල, පොතුවිල්, ආලයඩිවෙම්බු, හා එරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල තවදුරටත් තම නිල සෙවණ	- එම -

		ගොඩනැගිලි වටිනාකම සිගාස් වැඩසටහන සඳහා ඇතුලත් කළ යුතුව ඇත.	
(iii)	සමාලෝචිත වර්ෂයට අදාළව මූල්‍ය නොවන වත්කම් සාරාංශයට (SA80) අනුව එක් එක් වත්කම් අයිතමවලට අදාළව ඉදිරිපත් කරන ලද හර කිරීම් එකතුව රු.3,440,139,546ක් ද, භාණ්ඩාගාර සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවෙහි (SA82) සමාලෝචිත වර්ෂය තුළ හර කිරීම් රු.145,225,657ක් ද සහ භාණ්ඩාගාර ශේෂ පිරික්සුම අනුව හර කිරීම් රු.136,927,445ක් ද වූයෙන් ශේෂයන් අතර නොසැසඳීම් පැවතුණි.	මූල්‍ය නොවන වත්කම්වල තිබූ දෝෂ නිවැරදි කිරීම සඳහා ජර්නල සටහනක් ඇතුළත් කර ඇත. ඒ අනුව එහි එක් එක් සංකේත අංකය යටතේ අගයට SA 21 මූල්‍ය අගය එකතු කළ විට SA80 ශේෂය සමඟ ගැලපේ. තවද, SA82 හි ශේෂයේ වෙනසක් ඇති අතර එය සිගාස් වැඩසටහන මඟින් වත්කම් ගොනු සකස් කිරීමේදී ඇතිව ඇති දෝෂයකි. සිගාස් ගොනුව රැගෙන භාණ්ඩාගාරය වෙත ගොස් එම වරද නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරමි	වෙනස්කම් හඳුනාගනිමින් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට පෙර භාණ්ඩාගාර මුද්‍රිත සමඟ සසඳා නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුය.
(iv)	මූල්‍ය නොවන වත්කම් සාරාංශයෙහි (SA80) 9152 වත්කම් අයිතමය යටතේ සමාලෝචිත වර්ෂය තුළ හර කිරීම් රු.684,376,370 ක් ලෙස දක්වා තිබුණ ද භාණ්ඩාගාර මුද්‍රිතවල වත්කම් මාසික සාරාංශ සටහන් අනුව එය රු.688,888,972 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් සාරාංශයෙහි සමාලෝචිත වර්ෂය තුළ හර කිරීම් රු.4,512,602 කින් වැඩියෙන් දක්වා තිබුණි.	මූල්‍ය නොවන වත්කම් සාරාංශයේ (SA-80) හි 9152 වත්කම් අයිතමයේ 2024 වර්ෂය තුළ මාසික හර කිරීම්වල එකතුව රු.688,888,972 ක් වන අතර එම වටිනාකම නිවැරදි බව කාරුණිකව දැනුම් දෙමි.	- එම -
(v)	සමුච්චිත මූල්‍ය නොවන වත්කම් වාර්තාව (SA82) අනුව සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට කෙරීගෙන යන වැඩ යටතේ රු.7,990,518 ක් වටිනා රජයේ නිවාස හා සංචාරක නිවාස ද රු.28,500,000 ක් වටිනා කාගෝ වාහන ලෙස එකතුව රු.36,490,518 ක් පවතින බව දක්වා තිබුණ ද භෞතිකව එවැනි කෙරීගෙන යන වැඩක් හෝ කාගෝ වාහන ද නොපැවතුණි.	සිගාස් ඒකාබද්ධ ගිණුම් සාරාංශයේ හා භාණ්ඩාගාර මුද්‍රිත (SA82) සඳහන් දත්තයන්හි නොගැලපීමක් ඇත. මේ සම්බන්ධව භාණ්ඩාගාර නිලධාරීන් සමඟ සාකච්ඡා කළ අතර මෙය සිගාස් පද්ධතියේ ඇතිව ඇති දෝෂයක් බැවින් භාණ්ඩාගාරය වෙත අදාළ සිගාස් ගොනුව රැගෙන ගොස් නිවැරදි කිරීමට කටයුතු කරමි.	භාණ්ඩාගාර ශේෂයන් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගිණුම් ශේෂ පරීක්ෂා කර නොසැසඳීම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට පෙර නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුය.
(vi)	සමාලෝචිත වර්ෂය ආරම්භක දිනට මූල්‍ය නොවන වත්කම් ගිණුම් සාරාංශ වාර්තාවෙහි (SA80) වත්කම් අයිතම හතරකට අදාළ ආරම්භක ශේෂය රු.7,392,945,922 ක් වුවද	2023 වර්ෂයේ අවසන් ශේෂයෙහි ඇතිව ඇති දෝෂයක් වන අතර එය නිවැරදි කිරීම සඳහා ජ'නල සටහනක් භාණ්ඩාගාරය වෙත	වෙනස්කම් හඳුනාගනිමින් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට පෙර

	සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවේ (SA82) තුළ එම වත්කම් අයිතම හතරට අදාළ ආරම්භක ශේෂය රු.10,677,482,178 කි. ඒ අනුව වාර්තා දෙකෙහි මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂයන් අතර රු.3,284,536,256 ක වෙනස්කමක් පැවතුණි.	යොමු කළද එය නිවැරදි වී නැත. නැවත ජ'නල සටහනක් භාණ්ඩාගාරය වෙත යොමු කර නිවැරදි කිරීමට කටයුතු කරමි.	භාණ්ඩාගාර මුද්‍රිත සමඟ සසඳා නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුය.
(vii)	මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂය තුළ දී මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වටිනාකම රු.78,816,549 ක් වුවද භාණ්ඩාගාර පොත් අනුව සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවේ (SA82) එය රු.145,225,657 ක් වූයෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා භාණ්ඩාගාර පොත් අතර මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වටිනාකමෙහි රු.66,409,108 ක වෙනසක් පැවතුණි.	සිගාස් ඒකාබද්ධ ගිණුම් සාරංශයේ හා භාණ්ඩාගාර මුද්‍රිත (SA82) සඳහන් දත්තයන්හි නොගැලපීමක් ඇත. මේ සම්බන්ධව භාණ්ඩාගාර නිලධාරින් සමඟ සාකච්ඡා කළ අතර මෙය සිගාස් පද්ධතියේ ඇතිව ඇති දෝෂයක් බැවින් භාණ්ඩාගාරය වෙත අදාළ සිගාස් ගොනුව රැගෙන ගොස් නිවැරදි කිරීමට කටයුතු කරමි.	වෙනස්කම් හඳුනාගනිමින් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට පෙර භාණ්ඩාගාර මුද්‍රිත සමඟ සසඳා නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුය.

(ආ) විගණන සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීම් ලෙස රු.78,816,549 ක් දක්වා තිබූ නමුත් එය තහවුරු කර ගැනීම සඳහා විගණනයට සාක්ෂි ඉදිරිපත් නොවුණි.	2024 වර්ෂයේ මූලධන වත්කම් අත්කර ගැනීම සඳහා එක් එක් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් දරන ලද වියදම සහිත වාර්තාව මඟින් දන්වා ඇත.	ප්‍රාදේශීය ලේකම් කාර්යාල අනුව හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල නියෝජනය වන පරිදි අත්පත් කරගනු ලැබූ මූලධන වත්කම් සම්බන්ධව විස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු 1.6.1(අ)(i) සහ (v) ඡේදයන්හි නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය		ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 09 ක් විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වැය විෂයන් 12 කට අදාළව ලබා දී තිබුණු රු.54,296,905 ක ප්‍රතිපාදනවලින් සියයට 25 සිට සියයට 49 දක්වා ප්‍රමාණයක් උපයෝජනය කර නොතිබුණි.	2024 පැවති ජනාධිපතිවරණයට පෙර පූර්වගාමී ජනධිපතිවරයාගේ වැය ශිර්ෂය යටතේ ලබාදුන් මූලධන ප්‍රතිපාදන ව්‍යාපෘති, ජනාධිපති ලේකම් කාර්යාලයේ උපදෙස් පරිදි අවලංගු කිරීමට සිදුවීම, වසර අවසාන මාසයන්හිදි විවිධ අමාත්‍යාංශ විසින් ලබාදුන් ප්‍රතිපාදන අදාල වියාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති බැවින් හා පැවති අයහපත් කාලගුණය හේතුවෙන් නැවත හරවා යැවීමට සිදුවිය.	විධිමත් වැඩපිළිවෙලක් හා අධීක්ෂණයක් සිදු කර ලබාදෙන ප්‍රතිපාදන අදාළ කාර්යයන් සඳහා සම්පූර්ණයෙන් උපයෝජනය කළ යුතු බවත්, හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක නොකළ පාර්ශව සම්බන්ධයෙන් පියවර ගැනීමත් කළ යුතුය.

3.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විගණන නිරීක්ෂණය		ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය** බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 2015 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රු.42,000,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණ ද 2021 වර්ෂය වන විට රු.16,695,573 ක් වියදම් කරමින් ඉදිකර තිබුණු එම ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා දමා තිබුණි. නැවත 2024 වර්ෂයේ රු.12,870,964 ක් වැයකර ඉදිකිරීම් සිදුකර තිබුණ ද ආරම්භයේ සිට වසර 10 ක් පමණ ගත වී ඇතත් ව්‍යාපෘතියේ වැඩ අවසන් කර නොතිබුණි.	2015 නොවැම්බර් 24 දින මෙම කොන්ත්‍රාත්තුව පිරිනමා ඇති අතර ව්‍යාපෘතිය නිම කළ යුතු කාල සීමාව දින 180 ක් වූ අතර ඉදිකිරීම් කටයුතු 2015 දෙසැම්බර් 01 ආරම්භ විය. නමුත් කොන්ත්‍රාත්කරුගේ නොසැලකිලිමත් භාවය, දුර්වල මූල්‍ය කළමනාකරණය වැනි හේතු මත මෙම ව්‍යාපෘතිය අර්ධ වශයෙන් අත්හරින ලද මට්ටමට පත්ව තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගත නොහැකි මට්ටමින් සැලකිය යුතු කාලයක් තිබුණි. තෙවන අදියර සඳහා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙතින් රු. මිලියන 13 ක ප්‍රතිපාදන ලබා දුන් අතර එමඟින් වහලය සකස් කිරීම, කපරාරු	නොසැලකිලිමත්ව කටයුතු කළ කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත්, විධිමත් වැඩපිළිවෙලක් යොදා ගොඩනැගිල්ල භාවිතයට ගත හැකි තත්ත්වයට පත් කිරීමටත් පියවර ගත යුතුය.

		කිරීම, බිම සුද මැදීම ජනෙල් සවි කිරීම, තීන්ත ගෑම, විදුලි පරිපථ සකස් කිරීම, ජල නල කටයුතු නිම කිරීමට කටයුතු කරන ලදි. වර්තමානයේදි මෙම සංස්කෘතික මධ්‍යස්ථානය කළමනාකරණය කර ගත හැකි මට්ටමේ පවතී.	
(ආ)	**සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය**		
(i)	සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ 2018 ඔක්තෝබර් 15 දිනැති චක්‍රලේඛ අංක NSE/EL/01/2018 හි 2.14 වගන්තිය ප්‍රකාරව වැඩිහිටි දීමනා ප්‍රමාද ගෙවීම් සඳහා විධිවිධාන සලසා තිබියදී, උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකතුව රු.2,707,900 ක මුළු වැඩිහිටි දීමනාවක් වැඩිහිටියන් 792 දෙනෙකු හට ගෙවා නොමැති අතර 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ එම මුදල් නැවත අමාත්‍යාංශය වෙත යවා තිබුණි.	සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ 2018/10/15 දිනැති චක්‍රලේඛ අංක NSC/EL/01/2018 හි 2.14 වගන්තිය ප්‍රකාරව ප්‍රමාද ගෙවීම් සඳහා විධිවිධාන සපයා තිබෙන්නේ දීමනා ලාභියෙකුට හදිසි අසනීප තත්ත්වයක් හෝ වෙන යම් සාධාරණ හේතුවක් මත පමණක් බැවින් ද එසේ නොමැති අවස්ථාවලදී අදාළ මාසය තුළ දීමනාව ලබා නොගන්නේ නම් එය නැවත ගෙවනු නොලැබේ යන්න ලෙස උපදෙස් සඳහන් කර ඇත. තව ද දීමනා ලාභීන්ගේ වාර්ෂික මුළු ප්‍රමාණය 26801 ක් වන අතර දීමනා ලබා නොගත් ප්‍රතිලාභීන් 792 කි. එය 4% කට අඩු ප්‍රමාණයක් බව කාරුණිකව දැනුම් දෙමි.	විධිමත් පරිදි කටයුතු කර අදාළ ප්‍රතිලාභීන් හඳුනාගෙන දීමනා ගෙවීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධ පියවර ගැනීමටත්, වැඩිහිටියන් වෙත අදාළ ප්‍රතිලාභ ගෙවීමටත් කටයුතු කළ යුතුය.
(ii)	සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ 2018 ඔක්තෝබර් 15 දිනැති චක්‍රලේඛ අංක NSE/EL/01/2018 හි 2.15 වගන්තිය ප්‍රකාරව අඛණ්ඩව මාස 03 ක කාලයක් වැඩිහිටි දීමනාව ලබා නොගන්නා ප්‍රතිලාභීන්ගේ නම් කමිටුව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පොරොත්තු ලේඛනයේ සිටින ඊළඟ ප්‍රතිලාභියා හට එම දීමනාව ලබා ගැනීමේ අවස්ථාව සලසා දිය යුතු වුවද උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එසේ කටයුතු කර නොතිබුණි.	සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ 2018.10.15 දිනැති චක්‍රලේඛ අංක NSC/EL/01/2018 හි 2.15 වගන්තිය ප්‍රකාරව අඛණ්ඩව මාස තුනක කාලයක් වැඩිහිටි දීමනා ලබා නොගන්නා ප්‍රතිලාභීන් වෙනුවට නව ප්‍රතිලාභීන් ඇතුළත් කිරීමේ දී ප්‍රමාදයක් සිදු වූයේ නියමිත දිනට මුදල් නොලැබීම, මාස කිහිපයක මුදල් එකවර ලැබීම ආදී කරුණු හේතුවෙන් පසුගිය	විධිමත් අධීක්ෂණයක් හා පසු විපරමක් සිදු කර නීතිමය විධිවිධාන ප්‍රකාරව සුදුසුකම් ලබන ප්‍රතිලාභීන් හට දීමනා ලබාදීම තහවුරු වන වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.

		වසරේ වැඩිහිටි දීමනා ලබා දීම අක්‍රමවත්ව සිදු වූ බැවින් හා රාජකාරී සඳහා ප්‍රමාණවත් නිලධාරීන් නොමැති වීම හේතුවෙනි. මෙම අතපසුවීම් මින් ඉදිරියට සිදු නොවීමට අදාළ පරිදි විෂය නිලධාරීන් සමාජ සේවා අංශය වෙත අනුයුක්ත කිරීමට කටයුතු කරමි.	
(ඇ)	**විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**		
	විශ්‍රාම වැටුප් දීමනා ගෙවීම් සම්බන්ධව නිසි ලෙස ගණනය කිරීම් සිදු නොකිරීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විශ්‍රාමකයින් 37 දෙනෙකු හට රු.2,026,913 ක විශ්‍රාම වැටුප් දීමනා වැඩියෙන් ගෙවා තිබුණි.	උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභීන් 37 දෙනෙකුට විශ්‍රාම වැටුප් දීමනා අතිරික්තයක් ගෙවා ඇති අතර එම ගෙවා ඇති රු.2,026,913 මුදල මේ වන විට අදාළ විශ්‍රාමිකයින්ගෙන් මාසිකව අයකර ගැනීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.	විධිමක් පරීක්ෂාවක් සිදු කර නිලධාරීන් විසින් අවිධිමත්ව කටයුතු කර ඇත්නම් පියවර ගැනීමටත්, වැඩිපුර ගෙවීම් කර ඇති මුදල කඩිනමින් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඈ)	**කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය**		
(i)	ග්‍රාම ශක්ති වැඩසටහන 2018 සිට 2023 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ ග්‍රාම ශක්ති සමිති සාමාජිකයන් වෙත ලබා දෙන ලද රු.183,669,297 ක ණය මුදලකින් රු.114,608,554 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගත යුතුව පැවතුණි.	2023 වර්ෂය සඳහා ග්‍රාම ශක්ති වාර්තාව අනුව අයවිය යුතු මුදල රු.79,784,717 ක් වූ නමුත්, 2024 වර්ෂයේදි එය රු.75,314,300 ක් දක්වා අඩුවී ඇත. හිඟ ශේෂය කඩිනමින් අයකරගන්නා ලෙස ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර ඇත.	කාලීනව හිඟ ණය අය නොකළ පාර්ශව වෙත පියවර ගැනිමටත් හිඟ ණය අයකර ගැනීමට කඩිනම් පියවර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ii)	ග්‍රාම ශක්ති වැඩසටහන සම්බන්ධයෙන් සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය මඟින් නිකුත් කරන ලද අංක SDB/SPV/GS/2022/චක්‍රලේඛ 01 හා 2022 ජුනි 28 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සක්‍රීයව පවතින ග්‍රාම ශක්ති මව් සමිතිවල පවතින මුදල් උපයෝගී කර ගනිමින් ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන් සඳහා, අත්‍යවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා	2025.03.31 දිනට අම්පාර දිස්ත්‍රික්කයේ අක්‍රිය ග්‍රාම ශක්ති සමිති 122 ක රු.14,131,718.30ක මුදලක් ඇති අතර එම මුදල සක්‍රිය ග්‍රාම ශක්ති සමිති වෙත යොමු කිරීමට පියවර ගන්නා ලෙස දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම්වරු දැනුවත් කර ඇත. ඒ අනුව රු.430,964 ක් දමන	සුදුසු ප්‍රතිලාභීන් තෝරාගෙන ණය නිකුත් කර වැඩසටහන් සක්‍රීයව සිදුකර ගෙන යාමට කටයුතු කිරීමත්, අක්‍රීය සමිති සක්‍රීය කිරීමට හෝ විධිමත් පරිදි කටයුතු කර ඒවායේ මුදල් රාජ්‍ය ආදායමට ගැනීම හෝ

	සහ සමිති සාමාජිකයන් සඳහා අත්‍යවශ්‍ය අනෙකුත් වැඩසටහන් සඳහා වන ව්‍යාපෘති සඳහා යොදාගත හැකි වුවද අම්පාර දිස්ත්‍රික්කය තුළ ලියාපදිංචි සමිති 234 අතරින් සක්‍රීයව පවතින සමිති 122 ක් චක්‍රලේඛය අනුව තම අරමුදල් භාවිතා නොකර තම බැංකු ගිණුම්වල එකතුව රු.27,561,514 ක මුදලක් නිෂ්කාර්යව රඳවාගෙන තිබූ අතර ලියාපදිංචි මුළු සමිති අතරින් 2025 ජුනි 30 වන විට අක්‍රීය සමිති 112 ක ඔවුන්ගේ බැංකු ගිණුම් තුළ සාමාජික අරමුදල් හා රජයේ අරමුදල් වශයෙන් රු.12,581,380 ක මුදලක් රඳවාගෙන තිබුණි.	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක වන සමිති වෙත මාරු කර ඇත.	කළ යුතුය.
(iii)	ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මඟින් අඩු ආදායම්ලාභී වැන්දඹු හා ගෘහ මූලික කාන්තාවන්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීම සඳහා අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක් තුළ 2010 සිට 2022 කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කරන ලද ණය ව්‍යාපෘති 05 ක් යටතේ පුද්ගලයින් 24 දෙනෙකුට අදාළව රු.99,496 ක් අය කර ගත යුතුව පැවතුණි.	කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය යටතේ පවතින ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මඟින් අඩු ආදායම්ලාභී වැන්දඹු හා ගෘහ මූලික කාන්තාවන්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීම සඳහා අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 05 ක් සඳහා ලබා දුන් ණය මුදල් අයවීමට ඇති අතර මෙම ණයලාභීන් සියළු දෙනාගෙන්ම ගෙවීම් එකඟතා ලබා ගෙන ණය අයකර ගැනීමට අදාළ කටයුතු සිදුකර ඇත.	හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	**මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**		
	මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ ඇති සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් 2023 ජූලි 13 වන දින නිකුත් කර ඇති අංක MF/WBB/02NOTICE/D/DIV-2022 දරන ලිපිය මඟින් දක්වා ඇති පරිදි එක් ප්‍රතිලාභියෙකු පමණක් සිටින පවුලක එම ප්‍රතිලාභියා මියගිය හොත් ග්‍රාම නිලධාරි විසින් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය වෙත දන්වා එම ප්‍රතිලාභියාගේ ගෙවීම් නතර කළ යුතු වුවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල	අස්වැසුම ප්‍රතිලාභීන් මිය ගිය වහාම ඒ පිළිබඳව සුබ සාධක ප්‍රතිලාභ මණ්ඩලය දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙස ග්‍රාම නිලධාරීන් දැනුවත් කරන ලෙස සියළුම ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර ඇත. වැඩිපුර ගෙවන ලද මුදල නැවත අයකර ගැනීමට ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් පියවර ගෙන ඇත.	විධිමත් පරීක්ෂාවක් සිදු කර වැඩිපුර ගෙවීම් කර ඇති මුදල අදාළ වගකිව යුතු පාර්ශව වෙතින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

05 ක අස්වැසුම සුබසාධක ප්‍රතිලාභීන් 23 දෙනෙකුගේ ගිණුම්වලට ඔවුන් මිය යාමෙන් පසුව ද මුදල් බැරකර තිබුණි. ඒ අනුව අදාළ වසම්වල ග්‍රාම නිලධාරීවරුන්ගේ රාජකාරිය නිසි පරිදි ඉටු නොවීම හේතුවෙන් රජයට රු.825,250 ක මූල්‍ය අලාභයක් සිදු වී තිබුණි.

3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2024 වර්ෂය සඳහා වූ සහතිකවීම මේ සමඟ ඉදිරිපත් කර ඇත.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති, රීති හා රෙගුලාසි වලට යොමුව	**වටිනාකම රු.**	**අනුකූල නොවීම**		
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන	1,024,622	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය අනුව, සේවය අත්හිට වූ, සේවය	මේ වන විට අයවීමට ඇති මුදල රු.1,024,622 කි. විශ්‍රාම ගොස් ඇති නිලධාරීන්ගේ ණය ශේෂ ඔවුන්ගේ පාරිතෝෂික	හිඟ ණය කාලීනව අයකරීමට කටයුතු නොකළ

	සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වගන්ති		අත්හැර ගිය, රෝගී සහ විශ්‍රාම ගිය නිලධාරීන් ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් වර්ෂ 01 සිට වර්ෂ 10 ක කාල පරාසයක සිට හිඟ ණය අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.	මුදලින් අයකර ගැනීමට කටයුතු කර ඇත. සේවය හැර ගොස් සිටින අයගේ ණය ශේෂයන් නීති මඟින් හා ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.	නිලධාරීන්ට පියවර ගැනීමත් ආයතන සංග්‍රහය අනුව හිඟ ණය අයකර ගැනීමට පියවර ගැනීමත් කළ යුතුය.
(ආ)	**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** --------------------				
(i)	2001 අගෝස්තු 22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2001	–	එක් සේවා ස්ථානයක සේවය කළ යුතු උපරිම සේවා කාලය වසර පහක් සහ වසර පහ ඉක්මවා එක් සේවා ස්ථානයක සේවය කර ඇති සෑම නිලධාරියෙකුම වෙනත් සේවා ස්ථානයකට මාරු කළ යුතු වුවත් දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන නිලධාරීන් 26 දෙනෙකු වසර 05 සිට වසර 15 දක්වා කාලයක් එකම සේවා ස්ථානයක සේවයේ නියුතුව සිටින අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඔවුන් වෙනත් සේවා ස්ථානයකට මාරු කිරීමට කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	ඒකාබද්ධ සේවයේ නිලධාරීන් සඳහා, 2025 වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු ක්‍රියාවලියේදී සුදුසු අනුප්‍රාප්තිකයින් ගලපාගත නොහැකි වීමේ හේතුව මත වසර 05 ඉක්ම වූ නිලධාරීන් සඳහා ස්ථානමාරු ලබා දී නොමැති බවත් දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිංහල මාධ්‍යයෙන් රාජකාරි කටයුතු සිදු කෙරෙන අතර ඊට ආසන්නම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වන ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දෙමල මාධ්‍ය නිලධාරීන් සේවය කරනු ලබයි. සිංහල හා දෙමළ මාධ්‍ය නිලධාරීන් ස්ථාන මාරු කිරීමේ දී රාජකාරි කටයුතු වලදී ප්‍රායෝගික අපහසුතා ඇති වේ. එසේම, දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා අනෙකුත් සිංහල මාධ්‍ය	චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය.

				ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර පවතින දුර ඉතා වැඩි බැවින් නිලධාරීන් එදිනෙදා රාජකාරියට වාර්තා කිරීමේදී අපහසුතාවයන්ට පත් වේ. එබැවින්, වසර 05 ට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන්, ක්‍රමානුකූලව, පරිපාලනමය ගැටලු මතු නොවන ආකාරයට, 2026 වර්ෂයේ දී ස්ථාන මාරු කිරීමට කටයුතු කරමි.	
(ii)	රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2009 අප්‍රේල් 16 දිනැති හා අංක 2009/09 චක්‍රලේඛයේ 2.iv වගන්තිය සහ ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 (2.2) වගන්තිය	1,466,674	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක මාණ්ඩලික නිලධාරීන් තිදෙනෙකු හට පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ කිරීමකින් තොරව වැටුප් ලබා දී තිබුණි.	අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 හි මාණ්ඩලික නිලධාරීන් තිදෙනා විසින් විගණන විමසුම්වලට අදාළ කාල සීමාව තුළදී පැමිණීමේ ලේඛනයේ, පැමිණීම හා පිටවීම නිසි පරිදි සටහන් කර ඇති අතර මේ වන විට ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතයෙන්ද නිසි පරිදි පැමිණීම හා පිටවීම සටහන් කරයි.	චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු අතර ඊට පරිබාහිරව කටයුතු කර ඇති නිලධාරීන්ට විධිමත් පියවර ගත යුතුය.
(iii)	රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2009 අප්‍රේල් 16, 2009 ජූනි 17 සහ 2023 මැයි 12 දිනැති රජයේ චක්‍රලේඛ අංක 09/2009, 09/2009(i) සහ	1,900,943	වේලාව පදනම් කරගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ආදී නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කරගන්නේ නම්, එම කාලය ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් සනාථ කළ යුතු වුවද 2024 ජනවාරි සිට	නිවාඩු දින වැටුප්, අතිකාල ගෙවීමේදී ඇඟිලි සලකුණු යන්ත්‍රයේ දත්ත මත පදනම්ව ගෙවිය යුතු බවට ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර ඇත.	-එම-

	02/2021(viii)		සැප්තැම්බර් දක්වා කාලය තුළ පොතුවිල්, සයින්දමරුදු, ඉරක්කාමම්, කල්මුණ සහ අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මාණ්ඩලික නිලධාරීන් 19 දෙනෙකු හට ඇඟිලි සලකුණු තහවුරු ලබා ගැනීමකින් තොරව නිවාඩු දින දීමනා ගෙවීම් කර තිබුණි.		
(ඇ)	1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 454 පරිච්ඡේදයේ 191 වගන්තිය	–	රජයේ ඉඩමක් පුද්ගලයෙකුට, පුද්ගල කණ්ඩායමකට වාණිජමය අරමුණක් සඳහා ලබාදෙන විට ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ අවසර ලබා ගත යුතු බව සඳහන් කර ඇති නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ අවසරයකින් තොරව පෞද්ගලික සමාගම් 14 ක් වෙත දිගු කාලීන බදු පදනමට ඉඩම් ලබා දී තිබුණි.	අඩ්ඩාලච්චේන, පොතුවිල්, නින්දවූර් සහ අක්කරපත්තු යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් අදාල ඉඩම් දීර්ඝකාලින බදු පදනම මත ලබාදීමට සියළුම ලිපි ලේඛන පළාත් ඉඩම් කොමසාරිස් වෙත යොමු කර ඇති බවත් ඒ සඳහා අනුමැතිය ලද වහාම දීර්ඝ කාලින බදු අයකිරිමට පියවර ගන්නා බවත් අදාල ප්‍රාදේශීය ලේකම්වරු දැනුම් දී ඇත.	ඉඩම් ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර එසේ කටයුතු නොකළ නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය.

3.5 වංචනික ස්වරූපයේ ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක වන ගැබිණි සහ කිරිදෙන මව්වරුන් සඳහා පෝෂණ දීමනාව ලබාදීමේ වැඩසටහන	ගැබිණි සහ කිරිදෙන මව්වරුන් සඳහා පෝෂණ දීමනා ලබාදීමේ වැඩසටහන යටතේ සම්මන්තුර හා අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිදුව ඇති වවුචර්පත් වංචාව සම්බන්ධයෙන් සිදුකරන විමර්ශනවල ප්‍රගතිය වෙන් වෙන් වශයෙන්	විමර්ශන කඩිනම් කර නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමත්, මුලා අලාභය පියවා ගැනීමටත්, ඉදිරියේදී මෙවැනි තත්ත්ව වළක්වා ගැනීම සඳහා

යටතේ සම්මන්තුර සහ අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල 2022 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වවුචර් පත් බෙදා දීමේ ක්‍රියාවලිය තුළ මාණ්ඩලික නිලධාරීන්ගේ දුර්වල අධීක්ෂණය සහ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ක්‍රියාත්මක නොවීම මත විෂයභාර නිලධාරීන් දෙදෙනෙකු රු.5,356,000 ක මූල්‍ය වංචාවක් සිදුකර තිබුණි.

පහත පරිදි වේ.

- සම්මන්තුර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අදාළව පෝෂණ වවුචරපත් වංචාව සම්බන්ධයෙන් මූලික විමර්ශනය ඉරක්කාමම් සහකාර ප්‍රාදේශිය ලේකම් මගින් සිදුකර චෝදනා පත්‍ර කෙටුම්පත් සමඟ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකර ඇති අතර, මේ නිසා සිදුව ඇති පාඩුව නිෂ්චය කර ගැනිම වෙනුවෙන් මු.රෙ.104(3) යටතේ වාර්තා ලබා ගැනිමට කාර්තිව් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරිගේ සභාපතීත්වයෙන් යුතු කමිටුවක් පත් කර ඇත.මේ වන විට චෝදනාවට ලක්වූ නිලධාරිනිය සම්මන්තුර ප්‍රාදේශිය ලේකම් වෙත රු.1,350,000ක මුදලක් ගෙවා ඇත.

- අඩ්ඩාලච්චේන ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අදාළව පෝෂණ වවුචරපත් වංචාව සම්බන්ධයෙන් මූලික විමර්ශණය කාරතිවු සහකාර ප්‍රාදේශිය ලේකම් විසින් සිදුකර චෝදනා පත්‍ර කෙටුම්පත් සමඟ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් යොමු කර ඇත. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් ගේ අංක DP/6/2/2025 හා 2025 අප්‍රේල් 22 දිනැති ලිපිය අනුව, චූදිත නිලධාරිනිය වන උමරුලෙබ්බෙ සිත්ති සුහාරා මියගේ වැඩ තහනම් කර ඇත. මේ නිසා සිදුව ඇති පාඩුව නිෂ්චය කර ගැනිම වෙනුවෙන් මු.රෙ.104(3) යටතේ වාර්තා ලබා ගැනිමට නින්දවූර් ප්‍රාදේශිය ලේකම්ගේ සභාපතීත්වයෙන් යුතු කමිටුවක් පත් කර ඇත.

අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමටත් පියවර ගත යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජනාධිපති අරමුදල යටතේ අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අඩ්ඩාලච්චේන 07 ග්‍රාම නිලධාරි වසමෙහි ළමා ක්‍රීඩා පිටියක් හා වෙරළ උද්‍යානයක් පිළිසකර කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.2,925,000 ක් වැයකර සෙල්ලම් උපකරණ (REVOLI) සවිකර තිබුණි. 2023 දෙසැම්බර් 19 දිනැති මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛ MF/02/2023 හි 1.11 වගන්තිය ප්‍රකාරව ඉදිකිරීම් යෝජිත අරමුණ සඳහා අනාගතයේදී බාධාවකින් තොරව යොදාගත හැකි බව හා නඩත්තු සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කර ඇති බවට ප්‍රාදේශීය ලේකම් විසින් සෑහීමකට පත් විය යුතු වුවත් වසර 05 ක වගකීම් සහිත මෙම උපකරණ මිලදීගෙන මාස 06 ක් ඉක්ම වීමටත් පෙර කැඩී පිපිරී පළුදු වී තිබූ නමුත් ප්‍රාදේශීය ලේකම් විසින් ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	මේ සම්බන්ධයෙන් අදාළ වසම භාර ආර්ථික සංවර්ධන නිලධාරි 2025 අප්‍රේල් 09 දිනෙන් යුතුව ලිපියක් අඩ්ඩාලච්චේන ප්‍රාදේශිය ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව ප්‍රාදේශිය ලේකම් විසින් 2025 මැයි 19 දිනෙන් යුතුව මෙම උපකරණ කඩිනමින් අලුත්වැඩියා කර දෙන ලෙස ඉල්ලා ලිපියක් අදාල නිෂ්පාදක වෙත යොමු කර ඇත.	අදාළ ව්‍යාපෘතියේ අරමුණු ඉටුවන ආකාරයට කාර්යයන් විධිමත් වැඩපිළිවෙලක් යොදා ව්‍යාපෘතිවල තිරසර බව තහවුරු කර ගැනීමේ වැඩපිළිවෙලක් සකසා ක්‍රියාත්මක කළ යුතු අතර විධිමත් අධීක්ෂණයක් කර මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගත යුතුය.

4.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන වැඩසටහන - 2024 යටතේ දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වඩිනාගල ගම්මානයේ ගොවීන් වෙනුවෙන් වැය කිරීමට රු.4,967,175 ක අරමුදලක් ලබා දී තිබුණු නමුත් දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.	මෙම වැඩසටහන යටතේ දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වඩිනාගල ගම්මානයේ ගොවීන් වෙනුවෙන් කිරිගව පාලනය සඳහා රු.4,967,175 ක ප්‍රතිපාදන 2024 දෙසැම්බර් 03 දිනැතිව වෙන් වී තිබූ අතර ව්‍යාපෘතිය 2024 දෙසැම්බර් 31 දිනට අවසන් කළ යුතු විය. නමුත්, කිරි ගවයින් මිලදී ගැනීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ඉතා සංකීර්ණ ක්‍රියාවලියක් බැවින් සති 03 ක් ඇතුලත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර අවසන් කල නොහැකි බැවින්ද පැවති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන්	ප්‍රදේශයට ලැබෙන ප්‍රතිපාදන සංවර්ධන කටයුතු සඳහා යෙදවීමට ක්‍රියාකාරී සැලැස්මක් සකසා කාලීනව ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් අදාළ පාර්ශව වෙත පියවර ගත යුතුය.

		ද මෙම ව්‍යාපෘතිය ප්‍රායෝගිකව ඉටු කිරීම ගැටළු සහගත විය. ඒ අනුව, මේ පිළිබඳව කෘෂිකර්ම අමාත්‍යංශය දැනුවත් කර ප්‍රතිපාදන නැවත පවරා ගන්නා ලෙස දැනුම් දී ඇත.	
(ආ)	අඬ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත කොට්ඨාසයේ පාසලක් සඳහා ඉඩමක් අත්පත් කර ගැනීම වෙනුවෙන් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ලබා දී තිබූ රු.6,500,000 ක් අදාළ කාර්යය සඳහා උපයෝජනය නොකර තැන්පත් ගිණුමෙහි වර්ෂ 06 ක කාලයක සිට රඳවාගෙන තිබුණි.	අඬ්ඩාලච්චේන අල් අර්හම් පාසල සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ඉඩම් අමාත්‍යාංශයේ උපදෙස් හා නියෝග පරිදි සිදුවෙමින් පවතී. ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුත්ත ඉතා සංකීර්ණ හා දිගු කාලයක් ගත වන කාර්යයකි. ඒ අනුව ඉඩම් අත්කර ගැනීමේ පනතේ 2,4,5, හා 6 වගන්ති යටතේ වන කටයුතු මේ වන විට අවසන් කර 7 වගන්තිය යටතේ ගැසට් දැන්වීම රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බවත් ඉතා ඉක්මනින් 9 වගන්තිය යටතේ කටයුතු ආරම්භ කරන බවත් 10(1) හා 17 වගන්ති යටතේ අනෙකුත් කටයුතු ද ඉදිරියට කරගෙන යන අතර 17 වගන්තිය යටතේ කටයුතු සම්පූර්ණ වූ පසු එම තැන්පතු ගිණුමේ ඇති මුදල ඉඩම් හිමියාට ගෙවීම් කළ හැකි බවත් ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දී ඇත.	අදාළ ආයතන සම්බන්ධීකරණය කර කඩිනමින් ඉඩම් පවරා ගැනීමට පියවර ගත යුතුය.

4.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ 2009 ට පෙර ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් අවතැන් වූ, සාමාජිකයින් 03 දෙනෙකුට වැඩි පවුල් සඳහා නිවාස වැඩසටහන - 2023 යටතේ මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත රු.මිලියන 7.8 ක ප්‍රතිපාදන ලබා දී තිබූ අතර එයින් රු.3,200,000 ක ප්‍රතිපාදන ලබා දී තිබූ ප්‍රතිලාභීන් 04 දෙනෙකුගේ නිවාස ඉදිකිරීම්වලට අදාළ කටයුතු නිමකර නොතිබුණි.	අම්පාර දිස්ත්‍රික් ලේකම්ගේ අංක PLN/DEVE/16/RESET/HOUSE-2023 හා 2023 සැප්තැම්බර් 11 දිනැති ලිපිය අනුව මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉහත නිවාස යොජනා ක්‍රමය සඳහා රු.මි. 7.8 ක ප්‍රතිපාදන ලැබී ඇත. ඉහත ප්‍රතිපාදන මත පළමු අදියරේ වාරික මුදල 2023 නොවැම්බර් 09 හා 2023 දෙසැම්බර් 28 දිනයන්හිදී සමෘද්ධි බැංකු වෙත නිදහස් කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා සම්පූර්ණ වාරික මුදල් සඳහා ප්‍රතිපාදන එකවර නොලැබුණි. අම්පාර දිස්ත්‍රික් ලේකම්ගේ අංක	අධීක්ෂණ හා පසු විපරම් ක්‍රියාමාර්ග දැඩිකර නියමිත කාලය තුළ වැඩ ආරම්භ කිරීම හා ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන් කිරීමට පියවර ගත යුතුය.

PLN/DEVE/RESET/05/2024 හා 2024 ජුනි 06 දිනැති ලිපිය මගින් ඉතිරි වාරික මුදල් සඳහා ප්‍රතිපාදන ලැබුණු අතර 2024 ජූලි 31 දින වන විට සියලුම වාරික මුදල් සමෘද්ධි බැංකු වෙත නිදහස් කර අවසන් කර ඇත. ඒ අනුව නිවෙස් වල ඉදිකිරීම් සිදුවන ආකාරය අනුව වසම භාර ආර්ථික සංවර්ධන නිලධාරීගේ හා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය මත ප්‍රතිලාභීන් වෙත වාරික මුදල් ක්‍රමානුකූලව නිදහස් කිරීමට අවස්ථාව සලසා ඇත.

4.4 ප්‍රසම්පාදනයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කෘෂිකර්ම අමාත්‍යාංශයේ ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීමේ ව්‍යාපෘතිය යටතේ අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් සතුන් මිලදී ගැනීමේදී එළුවන් පිරිමි පැටවුන්ගේ බර කිලෝග්‍රෑමයක් සඳහා රු.1,600 ක් සහ ගැහැණු පැටවුන්ගේ බර කිලෝග්‍රෑමයක් සඳහා රු.1,200 ක් වැනි අඩු මිලකට ලබාගෙන තිබියදී එම කාල සීමාව තුළදී ම අඩ්ඩාලච්චේන, නින්දවූර්, ආලයඩිවෙම්බු සහ සම්මන්තුර යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පිරිමි සහ ගැහැණු එළුවන් අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මිලදීගත් වටිනාකමට සාපේක්ෂව ඉහළ මිලකට මිලදීගෙන ඇති බව නිරීක්ෂණය වූ අතර එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල එළුවන් කිලෝග්‍රෑම් 1286 ක් සඳහා රු.308,000 ක මුදලක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.	සම්මන්තුර හා අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ කාලයේදී ආගමික උත්සවයක්ද යෙදී තිබීම හා අනෙකුත් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයන්ද මෙම ව්‍යාපෘතියම ක්‍රියාත්මක කිරීම හේතුවෙන් එළුවන් සඳහා අධික ඉල්ලුමක් තිබූ බැවින් මිල ඉහළ යාමක් සිදුව තිබූ බවත් අවට ප්‍රදේශයෙන් මිලදි ගැනිමට අපහසු වූ බැවින් දුර බැහැර ප්‍රදේශයෙන් මිලදී ගත් බැවින් ප්‍රවාහන වියදම් දැරීමට සිදු වූ බවත් ප්‍රාදේශිය ලේකම්වරුන් විසින් දැනුම් දී ඇත. ආලයඩිවෙම්බු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මේ සඳහා වෙනම මිල කැඳවීම් නොකළ බවත් තිරුක්කෝවිල් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය එළුවන් මිලදි ගැනිමට ගත් ප්‍රසම්පාදන තීරණය මත මිලදීගෙන ඇත.	රජයට වාසිදායක වන පරිදි ප්‍රසම්පාදන සිදු කළ යුතු අතර විධිමත් පරීක්ෂණයක් පවත්වා වැඩිපුර ගෙවීම් සම්බන්ධයෙන් පියවර ගත යුතුය.

4.5 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය		ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් සංස්කෘතික මධ්‍යස්ථානයට භාණ්ඩ මිලදී ගැනීම සඳහා ජාතික ඒකාබද්ධතා, සමාජ ආරක්ෂණ සහ ජන මාධ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ලබා දුන් රු.353,000 ක මුදලින් පරිගණකයක් මිලදීගෙන තිබුණු නමුත් එය භාවිතයට නොගෙන ගබඩාව තුළ නිෂ්කාර්යව පැවතුණි.	බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට අයත්, වැව්ගම්පත්තුව උතුර, උහන, ප්‍රාදේශිය සංස්කෘතික මධ්‍යස්ථානයට ලබාදීමට මිලදී ගෙන ඇති එම භාණ්ඩ හා උපකරණ එම ගොඩනැගිලි පරිශ්‍රයේ භෞතික සුරක්ශිතතාව සකසා ජනගත සේවා සඳහා සුදුසු අයුරින් කළමනාකරණය කරන තෙක්, ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ගබඩාව තුල සුරක්ෂිතව රඳවා ඇති බව ප්‍රාදේශිය ලේකම් විසින් දැනුම් දී ඇත.	විධිමත් අධ්‍යනයකින් පසු අවශ්‍යතාවය හා භාවිතා කිරීමේ හැකියාව අනුව භාණ්ඩ මිලදී ගැනීම කළ යුතු අතර මිලදී ගන්නා ලද සියලු උපකරණ අදාළ කාර්යයන් සඳහා භාවිතා කළ යුතුය.
(ආ)	2024 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අක්කරපත්තුව - 20 ග්‍රාම නිලධාරී වසමට අයත් ප්‍රජා මධ්‍යස්ථානයකට රු.346,500 ක් වටිනා ශබ්ද විකාශන පද්ධති ආශ්‍රිත උපකරණ 12 ක් ලබා දී තිබූ නමුත් ඉන් උපකරණ 08 ක් පමණක් පෞද්ගලික ගොඩනැගිල්ලක ගබඩා කර තිබුණි. ඉතිරි උපකරණ 04 සම්බන්ධයෙන් විගණනයට සාක්ෂි ඉදිරිපත් නොවුණි.	2024 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අක්කරපත්තුව - 20 ග්‍රාම නිලධාරී වසමට අයත් බුලට් ප්‍රජා මධ්‍යස්ථානයට රු.346,500 ක් වටිනා ශබ්ද පද්ධති ආශ්‍රිත උපකරණ 12 ක් ලබා දී තිබූ අතර ගංවතුර තත්ත්වය හේතුවෙන් ගංවතුරෙන් ආරක්ෂා කර ගැනීම සඳහා වෙනත් ස්ථානයක තැන්පත් කර ඇති බව ප්‍රාදේශිය ලේකම් විසින් වාර්තා කර ඇත.	විධිමත් පරීක්ෂණයක් සිදු කර අදාළ භාණ්ඩ සත්‍ය වශයෙන්ම ප්‍රජා මධ්‍යස්ථානය භාරයේ පවතින්නේද යන්න සොයා බලා විධිමත් පියවර ගත යුතුය

4.6 පාඩු හා හානි

විගණන නිරීක්ෂණය		ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සද්ධාතිස්සපුර ගබඩාව 2015 සැප්තැම්බර් 21 දින සොරුන් විසින් විවෘත කර භාණ්ඩ රැගෙන යාම නිසා සිදු වූ පාඩුව රු.850,738ක් ලෙස තක්සේරු කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඒ පිළිබඳව ඉදිරි පියවර ගෙන නොතිබුණි.	සද්ධාතිස්සපුර ගබඩාව සොරුන් විසින් බිඳ දැමීම සම්බන්ධයෙන් මු.රෙ 104(4) අනුව අවසන් පරීක්ෂණ වාර්තා සකස් කර 2024 ඔක්තෝබර් 10 දින රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, ලේකම් වෙත යොමු කළද, එහි අඩුපාඩු සඳහන් කරමින් නැවත නිවැරදි මු.රෙ 104(4)	පරීක්ෂණ කටයුතු කඩිනමින් නිම කර අලාභය සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවලට පියවර ගැනීමත්, අලාභය පියවා ගැනීමටත් කටයුතු කළ යුතුය.

	අවසන් පරීක්ෂණ වාර්තාවක් යොමු කරන ලෙසට, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක HA/F/07/WRI16/001 හා 2024 ඔක්තෝබර් 30 දිනැති ලිපියෙන් දැනුම් දෙන ලදි. ඊට පිළිතුරු ලෙස අඩුපාඩු සම්පූර්ණ කරමින් සකස් කළ මු.රෙ 104(4) අවසන් පරීක්ෂණ වාර්තාව මගේ සමාංක හා 2025 මාර්තු 19 දිනැතිව ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමු කිරීමට කටයුතු කර ඇත.	

4.7 අනාර්ථික ගනුදෙනු

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2022/2023 මහ කන්නයේ වී මිලදී ගැනීමේ වැඩසටහන හා වී තොග බැහැර කිරීමේ වැඩසටහන සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2023 පෙබරවාරි 09 දිනැති හා අංක DRD/2023-1 දරන චක්‍රලේඛයේ 4.2 වගන්තිය අනුව වී මිලදී ගැනීමේ දී වන මෙහෙයුම් වියදම් අදාළ මුදල් රෙගුලාසි, චක්‍රලේඛ සහ අනෙකුත් රජයේ අනුමැතීන්ට යටත්ව සිදු කිරීමට දිස්ත්‍රික් ලේකම් විසින් පියවර ගත යුතු වුවත් අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සාමාන්‍ය ව්‍යාපෘති සඳහා පරිපාලන වියදම් වෙන් කරන පරිදි සමස්ථ ප්‍රතිපාදන මුදල වන රු.3,089,000,000න් 1% ප්‍රතිශතයක් ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක් සඳහා රු.30,890,000ක් පරිපාලන වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කරවා ගනිමින් චක්‍රලේඛයට පටහැනිව නිලධාරීන් විසින් සත්‍ය වශයෙන් දරන ලද වියදම නොසලකා හැර	අම්පාර දිස්ත්‍රික්කය තුළින් වී මෙට්‍රික් ටොන් 30000 ක් මිලදී ගත යුතු බවට සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව දැනුම් දී තිබූ අතර වී මිලදීගෙන පැය 24 ක් ඇතුළත අදාළ ගොවි මහතාගේ ගිණුමට මුදල් බැර කළ යුතු විය. මෙය ඉතාමත් සංකීර්ණ ක්‍රියාවලියක් වූ අතර රු. මිලියන 270 ක වටිනාකමින් යුතු වී තොගයක් මිලදී ගෙන ගොවීන් වෙත ගෙවීම් කිරීමට සිදුවිය. වී මෝල් හිමියන් තෝරා ගැනීම, ඔවුන් ලියාපදිංචි කිරීම, ගොවියන් හඳුනා ගැනිම, ඔවුන්ගෙන් මිලදී ගනු ලබන වී ප්‍රමාණය තීරණය කිරීම, වාර්තා සකස් කිරීම, බැංකු වෙත යොමු කිරීමට සිදුවීම, මෙම කාර්යන් සඳහා රාජකාරි වේලාවෙන් බැහැරවද රාජකාරි කිරීමට සිදුවිම, නිරන්තරයෙන් ක්ෂේත්‍රයට යාමට සිදුවීම, මෙම කටයුතු සඳහා පෞද්ගලික ජංගම දුරකථන ආදිය යොදා ගැනීමට සිදුවීම යන කරුණු මත පූර්වගාමී දිස්ත්‍රික් ලේකම් විසින් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විමසා ලද උපදෙස් අනුව කමිටුවක් පත් කර එහිදී එළඹි තිරණය පරිදි මෙම ගෙවීම් සිදු කර ඇති අතර ගෙවීමට	චක්‍රලේඛය ප්‍රකාරව සත්‍ය වශයෙන් දරන ලද පරිපාලන වියදම් පමණක් නිසි අනුමැතියකින් යුතුව ගෙවීම් කිරීමට කටයුතු කළ යුතු අතර ඊට පටහැනිව සිදු කර ඇති ගෙවීම් ආපසු අයකර ගත යුතුය.

	සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ වාචික උපදෙස් මත යැයි සඳහන් කරමින් අම්පාර දිස්ත්‍රික් ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් පත්කර ගනිමින් එම කමිටු තීරණය අනුව අදාළ නිලධාරීන්ගේ මූලික වැටුපෙන් ¼ ක වටිනාකමකට සමාන මුදලක් ඔවුන් ව්‍යාපෘතියට සම්බන්ධව වූ මාස ගණන මත පදනම්ව එකතුව රු.15,580,562 ක් පරිපාලන වියදම් ලෙස 2023 ජූලි මස වන විට ගෙවා අවසන් කර තිබුණි. තවද නියැදි විගණන පරීක්ෂණය අනුව උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ එක් එක් නිලධාරියාගේ මූලික වැටුපෙන් ¼ ක දීමනාවට අමතරව නිවාඩු දින වැටුප්, ගමන් වියදම් හා අතිකාල දීමනා වශයෙන්ද රු.367,181 ක් නිලධාරීන් 16 දෙනෙකු වෙත ගෙවීම් කර තිබුණි.	ප්‍රථම අංශ ප්‍රධානින්ගේ සහ අදාල ප්‍රාදේශිය ලේකම්වරුන්ගේ නිර්දේශය ලබා ගෙන ඇත.වෙන් කළ ප්‍රතිපාදන අවශ්‍ය බැවින් අතිකාල, ගමන් වියදම්, නිවාඩු දින වැටුප් ගෙවා ඇත.	
(ආ)	මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2023 පෙබරවාරි 09 දිනැති හා අංක DRD/2023-1 දරන චක්‍රලේඛයේ 2.3.2 වගන්තිය අනුව 2022/2023 මහ කන්නයේ වී මිලදී ගැනීමේ වැඩසටහන 2023 මාර්තු හා අප්‍රේල් මාස තුළ දී අවසන් විය යුතු වුවද 2024 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ ගබඩාවන් තුළ ඉතිරිව තිබූ සහල් කිලෝග්‍රෑම් 420,546 ක් හා වී කිලෝග්‍රෑම් 8,779,903 ක තොග සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය අවසන් වී නොතිබිය දී ඒ සම්බන්ධ පරිපාලන වියදම් ලෙස රු.15,580,562 ක මුදල නිලධාරීන් වෙත ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.	සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තු උපදෙස් මත වී මෙට්‍රික් ටොන් 30000 ක් මිලදී ගත්තද වෙනත් දිස්ත්‍රික්ක වලින් සහල් සඳහා ප්‍රමාණවත් ඉල්ලුම් නොලැබීම මත අපේක්ෂිත කාල සීමාව තුළ වැඩසටහන නිම කිරීමට නොහැකි විය. ඒ අනුව සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තු උපදෙස් පරිදි ඉතිරි වී තොග බැහැර කිරීම තවදුරටත් සිදුවෙමින් පවතී.	-එම-

4.8 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සමඟිපුර සමෘද්ධි බැංකුවේ 2025 පෙබරවාරි 24 දිනට කල් පසු වූ ණය රු.17,565,390 ක ශේෂයක් පවතින අතර එම ණය මුදල් අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ස්වයං රැකියා බොල් ණය (3201) - ණය ලාභියාට 1,2 සිහිකැඳවීම් ලිපි යවා ඇත. ජීවනෝපාය වක්‍රීය ණය - (3210) - වසම් වල නිලධාරින් ණය අයකර ගැනීම පිළිබඳව දැනුවත් කර ඇත. ජීවනෝපාය සංවර්ධන ණය - (3219) - දැනට මෙම ණය ශේෂය රු.9,548,192 කි. රු.233,024 ක් අයකර ගැනීමට කටයුතු කර ඇත. සම්පත ණය (3220) - දැනට මෙම ණය ශේෂය රු.7,359,073 කි. රු.68,104 ක් අයකර ගැනීමට කටයුතු කර ඇත. මෙම ණය අයකර ගැනීම සම්බන්ධව මහඔය ප්‍රාදේශීය ලේකම් විසින් ක්ෂේත්‍ර නිලධාරීන් වෙත වසම් මට්ටමින් රැස්වීම් පවත්වා, පෞද්ගලිකව නිවෙස් වලට ගොස් 2025 අප්‍රේල් 30 දිනට පෙර ණය ගෙවීම් කටයුතු සිදුකරන ලෙස දැනුවත් කිරිම් සිදු කරන ලෙස පවසා ඇත. එමෙන්ම 2025 අප්‍රේල් 30 දිනෙන් පසු මෙම ණය සියල්ලම සමථ මණ්ඩලයට ඉදිරිපත් කිරිම සඳහා ද අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස මහඔය ප්‍රාදේශීය ලේකම් විසින් විෂය නිලධාරී ද දැනුවත් කර ඇති බව වාර්තා කර ඇත.	හිඟ ණය කාලීනව අය කිරීමට කටයුතු නොකළ නිලධාරීන් හට පියවර ගැනීමටත්, හිඟ ණය ශේෂයන් කඩිනමින් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ආ)	අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමෘද්ධි ප්‍රජා මූල බැංකු 45 ක් හරහා ප්‍රතිලාභින් 443,779 දෙනෙකුට රු.15,515,924,709 ක ණය මුදල් ලබා දී තිබූ අතර 2025 පෙබරවාරි 28 දින වන විටත් ප්‍රතිලාභීන් 33,976 දෙනෙකුගේ රු.2,685,152,942 ක් අය කරගෙන නොතිබූ අතර ඉන් ප්‍රතිලාභීන් 4630 දෙනෙකු රු.337,025,097 ක් බොල් ණය ලෙස හඳුනාගෙන තිබුණි.	මේ පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් ලබා ගැනීම සඳහා කමිටුවක් පත්කර ඇති බවත් බොල් ණය විශ්ලේෂනය කර බොල් ණය අවම කිරීම සම්බන්ධව සැලසුමක් ඉදිරිපත් කරන ලෙස එම කමිටුවට දන්වා ඇති බවත් බොල්ණය විශ්ලේෂණය සම්බන්ධයෙන් සවිස්තරාත්මක වාර්තාව සහ බොල් ණය අවම කිරීමේ අදාළ සැලසුම කමිටුව විසින් ලබා දුන් වහාම සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන බවත් දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ දැනුම් දී ඇත.	-එම-

(ඇ)	ජනාධිපති ලේකම් කාර්යාලයේ විශේෂ අරමුදල් වැඩසටහන යටතේ සම්මන්තුර මුස්ලිම් මහා විද්‍යාලයේ මායිම් තාප්පය ඉදිකිරීම් ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුවේ සඳහන් ගිවිසුම් කාලය තුළ වැඩ නිම නොකළ හොත් කොන්ත්‍රාත්කරුගේ මුදලින් දිනකට සියයට 0.05 ක ප්‍රමාද ගාස්තුවක් අයකළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් දින 52 ක් සඳහා රු.116,073 ක ප්‍රමාද ගාස්තුවක් අයකර ගත යුතුව පැවතුණි.	මෙම ව්‍යාපෘතිය සඳහා ගිවිසුම් අත්සන් කිරීම 2024 අගෝස්තු 30 දින සිදු කළද අඛණ්ඩව පැවති වර්ෂාව හේතුවෙන් ප්‍රධාන කාණුව හරහා විශාල ජල ප්‍රවාහයක් ගමන් කිරීම හේතුවෙන්ද ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රධාන විභාග මධ්‍යස්ථානයක් ලෙස භාවිතා වීම හේතුවෙන්ද උසස් පෙළ විභාග මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වූ බැවින්ද ජනාධිපතිවරණ හා පාර්ලිමේන්තු මැතිවරණ ඡන්ද මධ්‍යස්ථානයක් ලෙස භාවිතා වූ බැවින්ද අඛණ්ඩ වැසි හා ගං වතුර තත්ත්වය හේතුවෙන් අමුද්‍රව්‍ය සපයා ගැනීමට අපහසු බැවින් ද නිසි කාල සීමාව තුළ නිම කර ගැනීමට නොහැකි වූ බැවින් ඉදිකිරීම් කටයුතු ප්‍රමාද බවත් එබැවින් ප්‍රමාද ගාස්තු අය නොකළ බවත් ප්‍රාදේශිය ලේකම් විසින් වාර්තා කර ඇත.	අදාළ ව්‍යාපෘති නියමිත කාල සීමාව තුළ නිමකළ යුතු වීම සහ ප්‍රමාදවීම් වලට අදාළ ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත් කරුවන්ගෙන් අයකළ යුතුය.
(ඈ)	ජනාධිපති ලේකම් කාර්යාලයේ විශේෂ අරමුදල් වැඩසටහන යටතේ 2024 දෙසැම්බර් මාසයේ දී සම්මන්තුර මුස්ලිම් මහා විද්‍යාලයේ ගේට්ටුව ඉදිකිරීම් ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුවේ සඳහන් ගිවිසුම් කාලය තුළ වැඩ නිම නොකළ හොත් කොන්ත්‍රාත්කරුගේ මුදලින් දිනකට 0.05% ක ප්‍රමාද ගාස්තුවක් අයකළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් දින 88 ක් සඳහා රු.209,746 ක ප්‍රමාද ගාස්තුවක් අයකර ගත යුතුව පැවතුණි.	මෙම ව්‍යාපෘතිය සඳහා ගිවිසුම් අත්සන් කිරීම 2024 ජූලි 26 දින සිදු කළද අඛණ්ඩව පැවති වර්ෂාව හේතුවෙන්ද ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රධාන විභාග මධ්‍යස්ථානයක් ලෙස භාවිතා වීම හේතුවෙන්ද උසස් පෙළ විභාග මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වූ බැවින්ද ජනාධිපතිවරණ හා පාර්ලිමේන්තු මැතිවරණ මධ්‍යස්ථානයක් ලෙස භාවිතා වූ බැවින්ද අඛණ්ඩ වැසි හා ගං වතුර තත්ත්වය හේතුවෙන් අමුද්‍රව්‍ය සපයා ගැනීමට අපහසු බැවින්ද නිසි කාළ සීමාව තුළ නිම කර ගැනීමට නොහැකි වුවත් මේ වන විට අදාල ගේට්ටුව ඉදි කිරීම සම්පූර්ණයෙන්ම නිම කර ඇති බවත් එම හේතු මත ප්‍රමාද ගාස්තු අය නොකළ බවත් සම්මන්තුර ප්‍රාදේශිය ලේකම් විසින් වාර්තා කර ඇත.	-එම-
(ඉ)	2022/ 2023 මහ කන්නයේ වී මිලදී ගැනීමේ හා වී තොග බැහැර කිරීමේ වැඩසටහන යටතේ රජය විසින් වී මිලදීගෙන අඩු ආදායම්ලාභීන් වෙත සහල් ලබා දීමෙන් අනතුරුව සහල් මෝල් හිමියන් භාරයේ පැවති රජයේ වී තොග සහල් කර අලෙවි කිරීම සම්බන්ධයෙන් සංවර්ධන මූල්‍ය	2024.12.31 දිනට අයවිය යුතු මුදල් ගෙවා නොමැති විමෝල් හිමියන් සඳහා නීතිමය පියවර ගැනීමට තීරණය කර ඒ සඳහා අම්පාර පොලීසිය සමඟ එක්ව කටුයුතු කරමින් පවති. අයවිය යුතු හිඟ මුදල රු.මිලියන 154 දක්වා අඩු කරගෙන ඇත. එසේම උහන ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයට අයත් වි මෝල් හිමියන් වෙත	අයකර ගත යුතු සහල් ප්‍රමාණය කඩිනමින් අයකර ගැනීමට හා එසේ සහල් ලබා නොදෙන වී මෝල් හිමියන් සම්බන්ධයෙන් කඩිනමින් නීතිමය

දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද 2023 ජූලි 17 දිනැති හා අංක DFD/MD/GPPP/PD/Maha/2022/23 දරන ලිපිය අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඉතිරි වී තොග සම්බන්ධයෙන් 2023 සැප්තැම්බර් මස සිදුකරන ලද පළමු ටෙන්ඩරය අනුව තෝරාගත් ගැනුම්කරු හට සහල් අලෙවිකිරීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09 ක් යටතේ තෝරාගෙන තිබූ වී මෝල් 22 ක් විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදිය යුතුව තිබූ රු.154,064,224 ක් වටිනා සහල් කිලෝග්‍රෑම් 1,110,396 ක් 2025 මාර්තු 10 දින වන විටත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත භාර දී නොතිබුණි.	නඩු පැවරීමට අවශ්‍ය කටයුතු දැනටමත් ආරම්භ කරන ලෙසත් විමර්ශන කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලට අදාළ සහල් මෝල් හිමියන් සම්බන්ධයෙන් විගණන විමසුම් වාර්තා කඩිනමින් ලබා දෙන ලෙස විගණන අංශ වෙතින් ඉල්ලීම් කර ඇත.	ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.

(ඊ) **දීර්ඝ කාලීන බදු අයකිරීම**

දමන, අක්කරපත්තු හා කල්මුණ යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ලබා දී තිබූ දිගු කාලීන බදු ඔප්පුවලට අදාළව රු.24,580,510 ක බදු මුදලක් 2024 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතුව පැවතුණි.	කල්මුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රජයේ ඉඩම්වල දීර්ඝ කාලීන බදු ශේෂය රු.4,603,063 ක මුදලක් අයකර ඇති බවත් අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අක්කරපත්තුව 13 ග්‍රාම නිලධාරි වසමේ පිහිටා ඇති පර්චස් 9.5 ක රජයේ ඉඩම වාණිජ අරමුණු සඳහා දිගුකාලීන බදු දීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත. දමන ප්රාදේශීය ලේකම් කොට්ඨාසයේ හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇත.	කාලීනව හිඟ බදු මුදල් අයකිරීමට පියවර නොගත් නිලධාරීන්ට පියවර ගැනීමටත්, හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.

5. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය		ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 2365 ක් ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 2808 ක් ද වූ අතර කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු 81 ක් පුරවා ගැනීමට හා 662 දෙනෙකුගෙන් යුතු අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් පරිදි අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම අතිරික්ත නිලධාරීන් 662 දෙනාම සංවර්ධන නිලධාරීන් වේ. සංවර්ධන නිලධාරීන් අමාත්‍යංශ මට්ටමෙන් බඳවා ගනු ලබන අතර අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව නොසලකා බඳවා ගෙන ඇති බැවින් මෙම තත්ත්වය උද්ගතව ඇත. මේ පිළිබඳව කළමනාකරන සේවා දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත. ප්‍රමාණවත් පුරප්පාඩු නොමැතිවීම, භාෂා ගැටලු පැවතීම හේතු මත මු.රෙ.71 යටතේ අනුමත කර ගැනීමටද ප්‍රතිපාදන නොමැත.	කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර අවශ්‍යම පුරප්පාඩු පමණක් පුරවා ගැනීමට හා අතිරික්ත කාර්යය මණ්ඩලය විධිමත් පරිදි තුලනය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය මඟින් නිකුත් කරන ලද 2023 අප්‍රේල් 19 දිනැති පත්වීම් ලිපිය අනුව කළමනාකරණ සේවා නිලධාරියෙකු එම සේවයේ I ශ්‍රේණියේ සිට අධි ශ්‍රේණියට කුසලතා පදනම මත උසස් කර තිබුණි. ඒ අනුව එම නිලධාරියා 2023 මැයි 23 වන දින සම්මන්තුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත නිදහස් කර තිබූ නමුත් විගණන දිනය වන 2024 අප්‍රේල් 18 දින වන විටත් ඔහු එම තනතුරෙහි වැඩ භාරගෙන නොතිබුණි. සේවා ස්ථානය වන සම්මන්තුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එම කාර්යාලයෙන් ඔහුව නිදහස් කළ පසුත් පෙර තනතුර සඳහා 2023 ජූනි සිට 2023 දෙසැම්බර් දක්වා මාස 07 ක වැටුප වන රු.434,840 ක් ගෙවීම් කර තිබුණි. ඔහුගේ පත්වීම් ලිපිය පරිදි එම ලිපියේ දින සිට සති 03 ක් ඇතුළත පත්වීම් භාර ගන්නේ ද නැද්ද යන්න පිළිබඳව දැනුම්දිය යුතු වුවද මාස 11 ක් ගත වී ඇතත් මේ වන තෙක් එවැනි ලිඛිත දැනුම්දීමක් ද සිදුකර නොතිබුණි.	රාජ්‍ය සේවා කොමිසමේ අංක PSC/APP/071520 හා 2023.03.30 දිනැති ලිපියෙන් අදාළ නිලධාරියා 2021.11.28 දින සිට ක්‍රියාත්මක වන පරිදි කළමනාකරණ නිලධාරි සේවයේ අධිපන්තියේ තනතුරකට පත් කර ඇත. 2023.05.23 දින සිට මෙම කාර්යාලයට අනුයුක්ත කර තිබූ ඔහු උහන ප්‍රාදේශිය ලේකම් වෙත කාර්යාලයේ රාජකාරී භාර නොගැනීම හේතුවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 98 වගන්තිය අනුව තවදුරටත් මෙම පත්වීම වලංගුද යන්න හා ගත යුතු ඉදිරි පියවර පිළිබඳව විමසා රාජ්‍ය සේවා කොමිසම වෙත ලිපියක් යොමු කර ඇත.	පවතින පුරප්පාඩු හඳුනාගෙන කාර්යය මණ්ඩලය අනුයුක්ත කිරීමට සහ එම නිලධාරීන් උපරිම කාර්යක්ෂමතාවයක් ලැබෙන පරිදි රාජකාරී සඳහා අනුයුක්ත කළ යුතුය.